ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධිය - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

ගිවිසුම් හා නියෝජ්‍යත්ව නීතිය - **LWU 2311**

කාලය - පැය 3 යි.

---

දිනය - 2007.03.06 වේලාව - පෙ.ව.10.00 - ප.ව.01.00 දක්වා

---

පළමුවන කොටසින් එක් ප්‍රශ්නයක් ද දෙවන කොටසින් ප්‍රශ්න හතරක් ද වනසේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

වෙනත් අයුරකින් ප්‍රකාශිතව දක්වා නොමැති අවස්ථාවලදී ප්‍රශ්නයක උප කොටස් සඳහා සමාන ලකුණු ලැබෙන බව උපකල්පනය කළ යුතුය.

## පළමුවන කොටස - නියෝජ්‍යත්ව නීතිය

මෙම කොටසින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "ප්‍රධානියා සහ නියෝජිතයා අතර පවතින සම්බන්ධතාවය, ඔවුන් අතර අයිතිවාසිකම් සහ යුතුකම් පැන නැගීමට හේතු වේ. කෙසේ වෙතත්, එක් පාර්ශ්වයකගේ අයිතිවාසිකම් අනෙක් පාර්ශ්වයේ යුතුකම් සමඟ අන්‍යාවශ්‍යයෙන්ම බැඳී ඇති බව පෙනේ."

    විමසන්න.

02. 2007 පෙබරවාරි 23 වන දින සිතාරා විසින් කොළ පැහැති ඇපල් මිලදී ගැනීම සඳහා තම නියෝජිත ලෙස අරුණව පත් කරන ලදී.

    තෙවන පාර්ශ්වයද ඇතුළත්ව, විවිධ පාර්ශ්වකරුවන්ගේ, යුතුකම් හා අයිතිවාසිකම් පහත සඳහන් අවස්ථාවලදී සලකා බලන්න.

    (අ) කොළපැහැති ඇපල් වෙනුවට අරුණ කොළ පැහැති මිදි කිලෝග්‍රෑම් 30 ක් ජයාගෙන් මිලදී ගත්තේය.

    (ආ) 2007 පෙබරවාරි 22 වන දින කොල පැහැති ඇපල් කිලෝග්‍රෑම් 30 ක් අරුණ මිලදී ගෙන තිබිණ.

    (ඇ) කොළපැහැති ඇපල් කිලෝග්‍රෑම් 30 ක් අරුණ විසින් මිලදී ගන්නා ලද අතර සිතාරා දෙනු ලැබූ කොමිස් මුදලට අමතරව රු.1250/- ක ලාභයක් උපයා තිබුණි.

    (ඈ) වෙළඳපලින් මිලදී ගත්තා යයි පවසමින් තමන් සතු කොළ පැහැති ඇපල් කිලෝග්‍රෑම් 30 ක් අරුණ විසින් සිතාරාට විකුණා තිබිණ.

03. "තෙවන පාර්ශ්වයද ඇතුලත්ව, පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ ප්‍රධානියා හෙලිකළ ප්‍රධානියකුද නැතිද යන්න මතයි."

ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විනිශ්චිත නඩු තීරණ කෙරෙහි අවධානය යොමු කරමින් විභාග කරන්න.

## දෙවන කොටස - ගිවිසුම් නීතිය

මෙම කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

04. පහත සඳහන් ඒවා පිළිබඳව කෙටියෙන් අදහස් දක්වන්න. ඔබගේ පිළිතුර සනාථ කිරීමට විනිශ්චිත නඩුතීරණ සහ අනෙකුත් සාක්ෂිත් අදාල කර ගැනීම අපේක්ෂා කෙරේ.

(අ) වඩාත් සංකීර්ණ ස්වරූපයක් ඇති ගිවිසුම්ගත පොරොන්දු බොහොමයක් "කොන්දේසි" හෝ "ප්‍රතිඥාභාර" ලෙසින් වර්ග කළ නොහැක්කේය..... ගිවිසුමේ ප්‍රකාශිතව දක්වා ඇතිවිටක හැර, එවැන්නක් කඩ කිරීමේ නෛතික ප්‍රතිඵල රඳාපවතින්නේ එය කඩ කිරීමට හේතු වූ සිද්ධියේ ස්වභාවය මිස පූර්වයෙන් පොරොන්දුවක් වර්ගීකරණය කළ 'කොන්දේසි' හෝ 'ප්‍රතිඥාභාර' යන්න ස්වයංක්‍රියව අනුගමනය කිරීම මත නොවේ.

(ආ) 'මූලික කඩ කිරීම' සහ 'පූර්වාපේක්ෂණ කඩකිරීම' යන්න ගිවිසුමක කොන්දේසියක් කඩ කිරීමක නෛතික ප්‍රතිඵල යන්න සමග අත්‍යවශ්‍යයෙන්ම බැඳී පවතී.

05. කිරිගම ගම්මානයේ 'ගොවි සංගමය' එම ගම්මානයේ කිරි නිෂ්පාදනය විධිමත් කිරීමේ අරමුණින් ගොවියන් සමග ගිවිසුමකට එළැඹිණ.

(අ) සංගමයේ සාමාජිකයන් තම කිරි නිෂ්පාදන ගොවි සංගමයට පමණක් විකුණන්නේ නම් සාමාජිකයන් නිෂ්පාදනය කරනු ලබන කිරි මිලදී ගැනීමට ගොවි සංගමය පොරොන්දු විය.

ගොවියන් ඔබගේ උපදෙස් පතයි. ඔවුනට උපදෙස් දෙන්න.

(ආ) ගොවි සංගමයට අයත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයේ ශීත ගබඩා පාලක වන බණ්ඩා කිරිගමේ සිට කිලෝමීටර 25 ක් ඇතුලත ගොවි සංගමයේ ව්‍යාපාරයට සමාන ව්‍යාපාරයක ශීතගබඩා පාලකයකු ලෙස කිසිදු අවස්ථාවක සේවය නොකිරීමට එකඟ වේ. නමුත් බණ්ඩාට තම රැකියාවෙන් ඉල්ලා අස්වී ආසන්න ගමක ශීතගබඩාවක ගබඩාපාලක ලෙස වඩා හොඳ වැටුපකට සේවය කිරීමට අවශ්‍ය වේ.

බණ්ඩා ඔබගේ උපදෙස් පතයි. උපදෙස් දෙන්න.

ශ්‍රී ලංකාවේ පවතින කිසිදු සමාන ව්‍යාපාරයක ශීත ගබඩා පාලක ලෙස සේවය නොකිරීමට බණ්ඩා එකඟ වී ඇත්නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද?

06. ෆැන්ටසි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ගාමිණී සමග 2007 පෙබරවාරි 01 වන දින එකඟවූයේ කොළඹ සිට ඔහුව නිලාවැලි වෙරළට රැගෙන යාමටයි. පරවි දූපත වටා මුහුදු සංචාරයක් ද මෙම ගමනට ඇතුලත් විය.

පහත සඳහන් අවස්ථාවල නෛතික තත්වය සලකා බලන්න.

(අ) ෆැන්ටසි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් තවත් දේශීය සංචාරකයන් පිරිසක් ද සමග 2007 පෙබරවාරි 10 වන දින ත්‍රිකුණාමලයට සාර්ථක ලෙස ළඟා විය. නිලාවැලියට යාමට ෆැන්ටසි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස්ට අවශ්‍ය වූවත්, නාවික හමුදා අණදෙන නිලධාරී විසින් පනවන ලද සීමා කිරීම් නිසා අවාසනාවන්ත ලෙස එම ගමන යාමට නොහැකි විය. එබැවින් ඔවුන් ආපසු කොළඹට පැමිණියහ.

(ආ) 2007 සෙබරවාරි 07 වන දින ෆැන්ටසි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් ප්‍රකාශ කර සිටියේ පූර්වාපේක්ෂණය නොකළ සිද්ධීන් එනම් රජය මගින් ඉන්ධන මිල ඉහළ දැමීම, අයහපත් කාලගුණය යනාදිය නිසා යෝජිත සංචාරය සිදුකළ නොහැකි තත්වයක තමන් සිටින බවයි.

07. (අ) 'තොරතුරු සන්නිවේදන තාක්ෂණ යුගයේ තැපැල් න්‍යාය අදාල වීම සඳහා ඉඩ ප්‍රස්ථාවක් නැත්තේ ය.'

විනිශ්චිත නඩු තීරණ ඇසුරින් උක්ත ප්‍රකාශයේ වලංගු භාවය කෙරෙහි අදහස් දක්වන්න.

(ආ) ගිවිසුමක අන්තර්ගත වන්නාවූ බැහැර කිරීමේ වගන්තිවල විෂය පථය නඩු තීන්දු මගින් සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් කොතෙක්දුරට සීමා වන්නේද යන්න සලකා බලන්න.

08. වැරදීම යන සංකල්පයේ දියුණුව කෙරෙහි <u>බෙල් එ. ලිවර් බ්‍රදර්ස් (1932) AC 161</u> නඩුවේ ස්වභාවය හා බලපෑම කෙතෙක් දුරටවීද යන්න විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

මෙම සංකල්පයේ වර්තමාන තත්ත්වය පිළිබඳව විනිශ්චිත නඩු තීරණ කෙරෙහි අවධානය යොමු කරමින් සලකා බලන්න.

09. අදාල අවස්ථාවන්හිදී විනිශ්චිත නඩු තීරණ කෙරෙහි අවධානය යොමුකරමින් පහත සඳහන් ඒවා සන්දන්දනය කර වෙනස්කම් දක්වන්න.

(අ) අවලංගු සහ අවලංගු කළහැකි ගිවිසුම්

(ආ) වංචාකාරී අවනිදේශනය සහ නොසැලකිලිමත් අවනිදේශනය

(ඇ) බාලවයස්කරුවන් ඇති කරගත් ගිවිසුම් සහ බීමත් තැනැත්තන් ඇතිකරගත් ගිවිසුම්

(ඈ) අන්‍යොන්‍ය වැරදීම හා පොදු වැරදීම.

10. පහත සඳහන් ඒවා පිළිබඳ සටහන් ලියන්න.

(අ) *Contra preferentum* රීතිය

(ආ) *in pari delicto potior est condito possidentis*

(ඇ) *donatio mortis causa* සහ *donatio inter vivos*

(ඈ) *deligatus non potest deligare*

- හිමිකම් ඇවිරිණි. -